

**'මා නිවත්ත අභික්කම' - නො නැවත ඉදිරියට යවු**

| | | |
|---|---|---|
| **59 වන කාණ්ඩය** | **බු.ව. 2560 නිකිණි මස පුරපසළොස්වක ද<br>ව්‍ය.ව. 2016 අගෝස්තු මස 17 වන ද** | **04 වන කලබ** |

# ප්‍රථම ධර්ම සංගීතිය



මහසුප් මහ තෙරිඳු
ඇතුළු පන්සියයක් වූ
මහ රහත් හිමිවරු
කළෝ මුල් සංගීතිය

නිකිණි පෝදවක
සිදුකළ ඒ සංගීතිය
දම් විනය රැක්මට
අසම පිටුබලයෙක් වී

සදහම පවතිනුව
සිදුකළ ඒ තුම් මෙහෙවර
සිහි කරමු බැති සිත් පා
ඒ උතුමන් කැර පිණිපා

**- අනඳ**



# ආදර්ශයට ගත යුතු චරිතයක්

සිරි වජිරාරාමාධිකාරිව වැඩ විසූ
අතිගරු පියදස්සි නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසිනි

## පසුගිය කලබ හා සබැඳේ

"මා ඉන්දියාවට පැමිණ අවුරුදු 22 කට වැඩි කාලයක් ගෙවී ගියේ ය. එසේ ඉන්දියාවට ආ මා කෙරෙහි බුදු මහිමය පිළිබඳව ඇතිවූ ප්‍රසාදය, භක්තිය වැඩී දියුණුව ගොස් මුළු ජීවිතය ම ඒ බුද්ධ භක්තියෙන් වෙළී පවතී"

"ඉවසීමත් අවිහිංසාවත් පිළිබඳ ලිපියක් සහිත සෙල් ටැඹ මා හට බෞද්ධ යුගයත් ධර්මාශෝක මහරජතුමාත් සිහිපත් කරවයි. එදා දඹදිව් වැසියෝ මිනිසුන් කෙරෙහිත් තිරිසනුන් කෙරෙහිත් අදට වඩා දයා මෛත්‍රී දැක්වූහ. බෞද්ධ යුගය ශාන්ත යුගයකි.

ධර්මාශෝක මහරජතුමා ගේ ශාන්ත වූ රාජ්‍ය කාලයෙන් පසු ඉන්දියාව නැවතත් කැළඹුණේ ය. අන්තිමේ දී යුරෝපීයයන් ගේ පැමිණීමෙන් පසු යට කී ධර්මස්තම්භය පිහිටි දිල්ලිය මිනිස් ලෙයිනුදු තෙමුණේ ය.

- චාර්ල්ස් ඇන්ඩෲස් දේවගැතිතුමා

ඇන්ඩෘස් මහතා කුඩා කල සිට ම පෙර දිගට ආශා කළ කෙනෙකි. ළමා කාලයේ පියා ඇසුරු කරද්දී ඇන්ඩෘස් තමා ගේ පියාණන්ගෙන් විදේශයන් පිළිබඳව නොයෙක් තොරතුරු දැනගති. ඉන්දියාව පිළිබඳ තොරතුරු ද ඔහුට දැනගන්නට ලැබුණි. කුඩා අවධියේ සිට ම ඉන්දියාව කෙරෙහි මහත් භක්තියක් ඇතිකරගත් කුඩා ඇන්ඩෘස් දිනක් අම්මා ළගට ගොස්: "මෑණියෙනි! ලොකුවුණාම මම ඉන්දියාවට ගොස් එහි ජීවිතය ගතකරන්නට කැමැත්තෙමි. ඉන්දියාවේ වාසය කරන හැම දෙන ම පාහේ බත් කන බව මම මාගේ තාත්තාගෙන් දැනගත්තෙමි. ඉතින් මා දැන් සිට ම බතට පුරුදු විය යුතුයි. එහෙයින් අම්මා මට හැමදම බත් ටිකක් දෙන්න ඕනෑය"යි ඉතා ඕනෑකමින් කීයේ ය. මේ ඇසූ මව ඉන්දියා ගමන සිදුනොවන දෙයක් හැටියට සලකා සිනාසුණ නමුත්, එවේලේ ඒ මෑණියන් කථාකරන විට ඒ හඬේ දුක්මුසු ගතියක් තිබුණු බවත්, චාර්ල්ස් ලොකුවුණාම කුඩුව අතහැර පියාඹා යන කුරුල්ලකු මෙන් ඉන්දියාව බලා යාදෝ යන බයකුත් අම්මා ළඟ තිබුණු බවත් ඇන්ඩෘස් වැඩිදුරටත් සඳහන් කෙරෙයි.

ඇන්ඩෘස් ගේ අම්මා අනෙක් හැමදරුවන්ට වඩා ඇන්ඩෘස්ට ප්‍රේම කළ බවත්, ඇන්ඩෘස් එසේ ම නොබිඳෙන මාතෘ ප්‍රේමයකින් යුතුව සිටි බවත් සඳහන් වේ. කෙසේ වුව ද ඇන්ඩෘස් වැඩි විය පැමිණි කල ඉන්දියාවට පැමිණ මහත්මා ගාන්ධි තුමා ගේ සම්භක්ත මිත්‍රයෙක් විය. ගාන්ධි තුමා කෙරෙහි මහත් විශ්වාසයක් හා ප්‍රේමයක් ඇතිකර ගනිමින් එතුමන් ගැන පොත්පත් ද ලීවේ ය. මහාත්මා ගාන්ධි හිරගෙයි රෝගාතුරව දුක් විඳින විට ඇවිත් ආදරයෙන් සාත්තු කළේ ය.

දැන් ඉතින් මේ ඇන්ඩෘස් බාලවියේ දී සිදුවූ සිද්ධියක් කියන්නෙමි. ළමයින් කුඩා කාලයේ දී ළමා ලීලාවෙන් කැළෑ

බැදව ගස් යට හැසිරෙමින් මල්පල ආදි දේ දකිමින්, ඒවා කමින් ස්වභාව ධර්මයේ රස විඳිමින් විනෝදයෙන් කල්ගත කිරීම සිරිතකි. ඉතින් එසේ හැසිරෙන විට කුරුල්ලන් කොබෙයියන් ආදි පක්ෂීන් ද ලේනුන් ආදි සිවුපා සතුන් ද දැක ඔවුනට ආදරය දක්වමින් කරුණාව පාමින් ඔවුන් රැක බලා ගැනීම කරුණාවන්ක ළමයින් ගේ සිරිතයි.

දිනක් ඇන්ඩෲස් එංගලන්තයේ තමා සිටි නගරය අසල කැලයක ඒ අත මේ අත හැසිරෙන විට කුඩා කුරුලු කූඩුවක් දුටුවේ ය. නගර ජීවිතයට ම පුරුදු වූ මේ ළමයා ඉතා ම ප්‍රීතියෙන් හා විනෝදයෙන් සෞන්දර්‍යය බලමින්, පක්ෂීන් ගේ මිහිරි නාද අසා ඔවුන් ගේ ඉරියව් දකිමින් හැසිරෙන විට මේ කුරුලු කූඩුව කෙරෙහි ආශාවක් ඇතිවිය. මේ කූඩුවේ ඉතා කදිම නිල්පාට පුල්ලි සහිත බිත්තර සතරක් තිබුණි. ඒ වේලාවේ මේ කරන්නේ හොඳක් ද නරකක් ද යන වගවත් සිතාගත නොහැකිව කුඩා ඇන්ඩෲස් මේ බිත්තර සතර ම රැගෙන ගෙදර ගොස් හපන් කමක් කළාක් මෙන් දෙමාපියන්ට දැක්වී ය. එසේ කළේ අම්මා සහ තාත්තාත් මේ බිත්තර දැක තමන් මෙන් ම ලොකු ප්‍රීතියක්, විනෝදයක් භුක්ති විඳීවි ය යන විශ්වාසයෙනි. එහෙත් සිදුවූයේ අනෙකකි. ඒ ප්‍රවෘත්ති ඇන්ඩෲස් මෙසේ කියයිඃ

"මාගේ මෑණියන් ඉතා කරුණාවෙන් හා මෘදු ලෙස මා පැත්තකට ගෙන ගියා. එසේ ගෙන ගොස් බිත්තර නැතිව මහත් දුකකින් කුරුලු අම්මා ඒ අත මේ අත කෑ ගසමින් ඉගිලෙන ආකාරයත් මට අවබෝධ කර දුන්නා. මට මගේ අම්මා ඒ කුරුලු අම්මාගේ දුක කියාදුන් ආකාරය කොතරම් මගේ සිතේ බලපෑවාද කියතොත් එතෙක් මගේ සිතේ තිබූ බලවත් ප්‍රීතිය, විනෝදය හිස් දියබුබුළක් මෙන් සැණෙකින් අතුරුදහන් විය. මගෙන් සිදුවන්නේ අපරාධයක්-වැරැද්දක්-

අයුත්තක් බව අම්මා මෙන් ම මගේ පියාත් මට කියා දුන්නේ ඉතා දයාවෙනි. මගේ අම්මාවත් තාත්තාවත් මට පොඩ්ඩක්වත් බැනවැදුණේ නැත. තරවටු කළේ නැත. එහෙත් මගේ සිතේ ඇතිවුණේ බලවත් කැළඹීමකි. මා එදින රාත්‍රිය ඉක්මවූයේ ඉතා අමාරුවෙනි. ඒ රාත්‍රිය ප්‍රීතිදායක නො වී ය. මගේ සංවේගය නිසා මට සතුටක් නො වී ය. පසුද හිමිදිරියේ ම බිත්තර සතරත් රැගෙන ඒ දුර ගමන මම පයින් ම ගොස් කැළයට වැදී තිබුණු තැන ම බිත්තර තැබීමට සිතාගෙන කැළයේ අස්සක් මුල්ලක් නෑර කූඩුව සෙවීමි. එහෙත් අහෝ මට එය සොයාගත නොහැකි විය. ඉතින් මගේ සංවේගය වඩාත් බලවත් විය.”

පසු කාලයක දී මහාජනයා අතර විශේෂයෙන් දඹදිව බොහෝ ප්‍රසිද්ධියට පත් ඇන්ඩෘස් මහතා බුදුරජාණන් වහන්සේටත් බුද්ධ ධර්මයටත් ඉතා ගෞරවාදර දැක්වී ය. බුදුරජාණන් වහන්සේ ඉගැන්වූ අහිංසා ධර්මයට ඉතා ම ප්‍රිය කෙළේ ය.

ළමයිනි! තථාගතයන් වහන්සේ බඳු වූ මහාකාරුණික, මහාප්‍රාඥ, මහාඅවිහිංසාවාදී උතුමෙක් ලොව පහළ වූයේ නැත. මැදහත්ව බලන කිසි කෙනකු උන්වහන්සේ ගේ අහිංසා ධර්මයෙහි අබමල් රේණුවක් තරමවත් වරදක් දුටුවේ නැත. බොහෝ අන්‍යාගම් කාරයෝ ද ඒ ධර්මය කෙරෙහි පැහැදුණාහ. ලොවට යුද බිය පැමිණ විපත්ති ළඟාවූ කාලවල දී “බුදුරජාණන් වහන්සේ බඳු උත්තමයෙකුත්, එබඳු නිර්මල ධර්මයකුත් දැන් අපට ඕනෑ ය”යි පෙර අවර දෙදිග බොහෝ උගත්තු එළියේ ම ප්‍රකාශ කළහ. කොතෙක් කල් ගිය ද ධර්මයේ අගය අඩුවීමක් නැත. එය හැම තැන ම හැම කල්හි ම බබළයි. එබඳු ධර්මයක් උරුම කොට ඇති හොඳ පින්වත් ළමයි ද කුඩා කල සිට ම සත්‍යයට, ධර්මයට ගරු කරන්නට, අවංක වන්නට උත්සාහ දරත්වා...!

ළමා පෙළට මඟුල් සුතුර - 4



# පතිරූපදේසවාසෝ ච
# සුදුසු දේශයක වාසය කිරීම

අදහන තුනුරුවන
සැදෑ සිල් ගුණ වඩවන
සදහම් හඬ ඇසෙන
රටක විසුම යි හැමට සුව දෙන

මෙ ලොව - පරලොව ගැන
පින - පව හොඳින් පහදන
කලණ දන නිවසන
රට යි විසුමට සුදුසු දෙස වන

සිනා මල් විහිදෙන
උනුන් දියුණුව සලසන
සමඟිය ගැන සිතන
රටක විසුම යි සැමට සුව දෙන

බෝග සරු පල දෙන
ගහ කොළ මලින් බබළන
ඇළ දොළ ගඟ ගලන
මෙ සිරිලක හැර රටක් වෙ ද වෙන

සමඟි සහවාසය
සැමට දෙන සන්තෝසය
මෙ ලංකා දේසය
කරමු අපි පතිරූපදේසය

**– "ගුරු සීයා" විසිනි**



# ළමා පෙළට භාවනාව - 1

**පූජ්‍යපාද ගම්පහ පාසාදික ස්වාමීන් වහන්සේ විසිනි**

පින්වත් පුතේ දුවේ,

අපේ ශරීරයේ තුවාලයක් හැදිල බලවත් වේදනාවකින් ඉන්නකොට ඒ තුවාලය පෑරුණොත් අපට වේදනා දෙකක් ම විඳින්න සිද්ධවෙනවා නේද? තුවාලයේ වේදනාවයි, තුවාලය පෑරුණ නිසා ඇතිවුණු වේදනාවයි. එක ම වෙලාවක දුක් වේදනා දෙකක් ම විඳින්න සිද්ධ වෙනවා කියන එක කටුක අමිහිරි අත්දැකීමක්.

ඒ වගේම තමයි පින්වත් දුවේ පුතේ අපේ ශරීරයේ උලක් හරි කටුවක් හරි ඇනිල අපි බොහොම අමාරුවෙන් අපහසුවෙන් ඉන්න වෙලාවක ඒ තැන ම තවත් උලක් හරි කටුවක් හරි ඇනුණොත් මොන තරම් නම් වේදනාවක් විඳින්න සිද්ධ වෙනව ද? ඒ වෙලාවෙත් වේදනා දෙකක් ම විඳින්න සිද්ධවෙනව නේ. ඒ විදියෙ වේදනා දෙකක් එක ම මොහොතක විඳින්න සිදුවන නිසා ඒ මොහොතෙ අපි බලවත් අපහසුතාවකට පත්වෙනව නේද?

පින්වත් පුතේ දුවේ, ඔබ හිතාගෙන ඉන්නේ තුවාල කියන දේවල් හැදෙන්නෙ අපේ ශරීරයේ විතරයි කියලා නේද? නෑ ඒක වැරදියි. තුවාල කියන දේ හිතෙත් හැදෙනවා. හිතේ හැදෙන තුවාලත් පෑරෙනව. ඒ වගේමයි හිතෙත් කටු, උල් වගේ දේවල් ඇනෙනවා. ඉතින් මොනවද මේ හිතේ හැදෙන තුවාල, මොනවද හිතේ ඇනෙන කටු, උල් කියලා තව ටිකකින් දැනගනිමු. දැනගෙන හිතේ තුවාලත් සනීප කරගෙන, හිතේ ඇනිලා තියෙන කටු, උල් ගලවල දමල හිත නීරෝගීව සුවපත්ව තියාගන්න උත්සාහ කරමු.

පින්වත් දුවේ පුතේ, අපේ ශරීරයේ තුවාල හැදෙන්නේ, කටු - උල් ඇනෙන්නේ අපේ ම වරදින් වෙන්නත් පුළුවන්. වෙනත් කෙනෙකුගෙ වරදින් වෙන්නත් පුළුවන්. හැබැයි අපේ හිත තුවාල වෙන්නේ, ඒ තුවාලය ආයෙ ආයෙමත් පෑරෙන්නේ, හිතේ කටු - උල් ඇනෙන්නෙ, ඇනිච්ච තැන්වලට කටු - උල් ආයෙ ආයෙමත් ඇනෙන්නෙ වෙන කාගෙවත් වරදකින් නම් නෙමෙයි. තමන්ගෙම වරදින්. ඒ වරද වෙන කිසි ම කෙනෙකුට පවරන්න බෑ.

අන්න ඒ නිසා තමයි අපේ ගෞතම සම්මා සම්බුදුරජාණන් වහන්සේ '**මේ හිත රැකගන්න, මේ හිතට ආරක්ෂාවක් හදල දෙන්න**' කියලා නිතර නිතර මහා කරුණාවෙන් අපට අවවාද අනුශාසනා කළේ. ඒ නිසා බුදුරජාණන් වහන්සේ ගේ පින්වත් ශ්‍රාවක දරුවන් වන පුතාලා දූලා නිතර ම උත්සාහ කරන්න ඕනේ

තමන්ගේ සිත රැකගන්න. හිත රැකගත්තේ නැත්තම් මොකද වෙන්නේ කියලා දන්නවා නේ? දුක් විඳින්න සිද්ධ වෙනවා. වෙන කාටවත් නෙමෙයි. තමන්ටමයි.

ඉතින් පින්වත් දුවේ පුතේ, මොනවද මේ හිතේ හැදෙන තුවාල? මොනවද මේ හිතේ ඇනෙන කටු - උල් ? ඒවා වෙන මොනවත් නෙමෙයි. අපි කවුරුත් දන්න, අපි කවුරුත් අහලා තියෙන කෙලෙස්. කෙලෙස් කියන දේවල් ශරීරයේ හැදෙන්නේ නෑ. කෙලෙස් හැදෙන්නේ හිතේ විතරමයි.

ආසාව නිසා හිතේ කෙලෙස් උපදිනව. තරහව නිසත් හිතේ කෙලෙස් උපදිනව. ඒ වගේම මෝඩකම නිසාත් හිතේ කෙලෙස් උපදිනව. ඉතින් මේ කෙලෙස්වලට හිත ඇතුළෙ හැසිරෙන්න ඉඩ දුන්නොත් අප අසහනයට පත්වෙනව. පීඩාවට පත්වෙනව. දුකට පත්වෙනව. එහෙම වුණාම ඉගෙන ගන්නත් බැරි වෙනව. පාඩම් කරපු දේත් අමතක වෙලා යනව. ඒක අපට ලොකු පාඩුවක්. ඒ නිසා හිත රැකගෙන අධ්‍යාපන කටයුතු දියුණු කරගන්න අපි මොනවද කරන්න ඕනෑ කියලා ඊළඟ හඳ පිරෙන පෝය දවසේ දි දැනගනිමු.

එතෙක් පින්වත් පුතුට, දුවට උතුම් තෙරුවන් සරණයි....!



# පුංචි සිනා මල්

පුෂ්පා ජයවර්ධන නැන්ද විසිනි

කිණිහිරි මලකට පාට කොයින්දෝ
අහසට තරු මල් කොයින් ඇහින්දෝ
කුරුල්ලන්ට රස ගීත කොයින්දෝ
පුංචි මුවට මල් හිනා කොයින්දෝ

සමනලයිනි ඔබ කොහි යන්නේදෝ
මල්වල පැණි බී ඉගිලෙන්නේදෝ
හඳ හාමිට සඳ සාවි කොහින්දෝ
පුංචි මුවට මල් හිනා කොයින්දෝ

කලාමැදිරියට එළිය කොහින්දෝ
දේදුන්නට නෙක පාට කොහින්දෝ
කිරි සයුරට රළ පෙළ කොහිබින්දෝ
පුංචි මුවට මල් හිනා කොයින්දෝ

පුංචි මුවින් බුදු ගුණ ම ගැයෙන්නයි
පුංචි සවන් දහමින් ම සැදෙන්නයි
පුංචි සිතට තිසරණ සෙත් වෙන්නයි
පුංචි සිනා මල් තව වැඩි වෙන්නයි



# සිවු සඟරාවත්

**සිරි වජිරාරාමාධිකාරීව වැඩ විසූ
අතිගරු දෙණිපිටියේ සුමනසිරි මාහිමිපාණන් වහන්සේ විසිනි**

මිනිසුන් විසින් ඒ ඒ අවස්ථාවන්හි දී ඔවුනොවුන් හට සංග්‍රහ කළ යුතු ය. එය පැහැර හරින තැනැත්තාට සතුටක් නැත. එහෙයින් ඔහුට මෙලොවැ වාසය කිරීම අපහසු ය. ලොවින් වෙන් වූ අයකු මෙන් වන බැවිනි.

අප බුදුරජාණන් වහන්සේ ලොවැසියනට සංග්‍රහ කිරීමට කරුණු සතරක් වදාළහ. දීම ය, ප්‍රිය වචන කථාකිරීම ය, අනුන් ගේ යහපත සඳහා කටයුතු කිරීම ය, සමාන පැවැත්මෙන් කල්යැවීම ය යන මොහු ය. මෙය සිවු සඟරාවත් (සතර සංග්‍රහ වස්තු) නම් වෙයි. මහා ජනයාගේ සිත් දිනාගෙන රට පාලනය කිරීමට අවශ්‍ය වන බැවින් රජකු කෙරෙහි ද මෙය වෙසෙසින් ඇතිවිය යුතු කරුණු සතරෙකි. ගමන්ගත් රථයට පැණ ඇණය-කඩ ඇණය යම්සේ උපකාර ද එසේ ම මෙලොව ජීවිත යාත්‍රාව සඳහා මේ සිවු සඟරාවත් පිහිට වෙයි.

යම් හෙයකින් කඩ ඇණය පැන ගියොත් රෝදය පැන ගොස් බඩු සුන්වී රථය කැඩියන්නාක් මෙන් ජීවිතය ද ගෙන යා නොහැකි බැවින්,

**එතෙ ඛො සංගහා ලොකෙ**
**රථස්සා'ණී'ව යායතො** යි උපමා කොට බුදුහු වදළහ.

එයින් පළමු සංග්‍රහය නම් දීමයි හෙවත් දනය යි. පුද අදහසින් ගුණවතුන් හට ද අනුකම්පාවෙන් කරුණාවෙන් යාචකාදීන් හට ද යමක් පුදා ද දේ ද එය දන නමි.

ආදිකල්පික මිනිසුන් ද නොයෙක් අදහසින් නානා දේ දුන්බව පෙනේ. බුදුරජාණන් වහන්සේ එය පින්කමක් බවත් ලෝභය නැසීමට ඇති එක ම මග බවත් දැනගත් සේක. සසර දී කළ පුරුදු ඇතුව ම එහි අනුසස් දැන වදළහ.

මේ දීම පුරුදුකළ යුත්තකි. නැතහොත් අමාරු ය. ලෝභය මට්ටු කිරීමට අමාරු බලවත් අකුසල් මුලක් ය. නිවන සොයන්නට සිතූ අප මහ බෝසතුන් සුමේධ පණ්ඩිත වැ උපන් කල පරම්පරා සතකින් රැස් වැ තුබූ මහා ධනස්කන්ධය දුගී මගීන් හට දුන්නේත් දීම ගුණධර්මයක් බවත් ලෝභය නැසීමට ඇති හොඳ ම මාර්ගය එය බවත් දැනගත් බැවිනි.

සාමාන්‍ය මහාජනයා අතරින් බැහැර නො යැවිය හැකි මේ දීම මරණ විපත් ලෙඩදුක් ආදි අවස්ථාවන්හි ඉටු කිරීමෙන් ඉතා ආවශ්‍යක යුතුකමක් යැයිද සැලැකිය හැකි ය. එබැවින් දශරාජ ධර්මයන්හි දී ද මුල් තැන් ගන්නා මේ දීම ලොවැසි කවුරුන් විසින් වුව ද පුහුණු කළ යුතු ය.

දෙවන සංග්‍රහය නම් ප්‍රිය වචන කථා කිරීමයි. ලොවැ කථාකරන එක ම සත්ත්වයා මිනිසා ය. කථාව නරක් වුවහොත් ඔහු ගේ ජීවිතය වැඩ නැති එකකි. රට වැසියෝ ඔහුට ප්‍රිය නො කරති. ඔහුගේ මුවින් සතුරන් මවයි නැතහොත් වවයි.

එබැවින් මෙය කුඩාකල්හි පටන් පුහුණුකළ යුතු දෙයකි. වියදමක් මහන්සියක් නැතුව රටේ යහතින් කවුරුන් අතරත් සිත් දිනා ගෙන කල් යැවිය හැකි මාර්ගයකි. බුදුරජාණන් වහන්සේ **පියවාචමෙ'ව භාසෙය්‍ය** යනුවෙන් ප්‍රිය වචනයක් මැ කථාකළ මැනැව යි වදාළේ එහෙයිනි. ගිය ගිය තැන අවුල් වියවුල් වැ කටයුතු පිරිහෙළාගෙන විපතට පැමිණෙන්නෝ මේ ප්‍රිය වචන නැති තැනැත්තෝ ය.

"**පුඤ්ඤවන්තා නාම මනාපකථා හොන්ති**" යනුවෙන් පින්ඇත්තෝ නම් අනුන්ගේ සිත් දිනාගත හැකි ප්‍රිය මනාප කථා ඇත්තෝ යැයි බුදුහු වදළහ.

විශාඛා ආදි සිටු දියණියනට කුඩා වියෙහි සිට මෙය මැනැවින් පිහිටි උතුම් ගුණයකි. එහෙයින් ඕ මහරජු පටන් මෙහෙකරුවා දක්වා ඇති හැමදෙනාගේ ම සිත් දිනාගත්තා ය. නිවන් මඟත් ප්‍රත්‍යක්ෂ කළා ය.

තෙවන සංග්‍රහය නම් අනුන්ගේ යහපත සඳහා කටයුතු කිරීම යි. එසේ නො කරන්නේ නියම මිනිසෙක් නොවේ. මෙලොවැ ඇති හැම දෙයක් ම මිනිසාගේ යහපත සඳහා උපකාර වේ නම් මිනිසා ම මිනිසාට උපකාර නොවීම පුදුම විය යුත්තෙකි.

තම බඩ වඩා ගැනීම තිරිසනකුගේ ද වැඩකි. මිනිසකුගේ ජීවිතය ඉනබඩ වඩාගැනීමට ම සීමා කෙරේ නම් එය තිරිසන් ජීවිතයට ද වඩා පහත් ය අධම ය.

අනුන්ගේ ද යහපත සඳහා තමන් ගේ ජීවිතය ධනය කාලය උගත්කම යොදන මනුෂ්‍යයා උතුමෙකි. ඔහුගෙන් රට සැනසේ. හේ ලෝවැසියාට ප්‍රිය ය. ඔහුට අදරින් ම ගරු කෙරෙති.

අප මහ බෝසතුන් සසරැ සැරිසැරූ කල අනුන්ගේ යහපත හෙවත් පරාර්ථය සඳහා කටයුතු කළ අයුරු බෝසත් සිරිතින් මැනවින් දතහැකි ය.

එහෙයින් "ඔව්හු පරවැඩ ඇත, අසිපත්‍ර වනයෙහි දු වසත් නන්දන වනයෙහි සෙයින් වෙසෙති. පරවැඩ නැත, නන්දන වනයෙහි දු වසත් අසිපත්‍ර වනයෙහි සෙයින් වෙසෙත්"යි පැවසූහ.

සිවුවන සංග්‍රහය නම් මහා ජනයාට ගැළපෙන පරිදි කල් යැවීමයි. යමකුගේ පැවතුම් යම් යම් විට නොසම නම් හේ රටට නො ගැළපෙන විසම පුද්ගලයෙකි. ඔහු සමග ආශ්‍රය කිරීමට හෝ කටයුතු කිරීමට හෝ මහා ජනයා ප්‍රිය නො වෙයි. ඔහු වෙන් කොට කොන් කොට ගැළපෙන අය එක් වැ කටයුතු කෙරෙති. එහෙයින් විසම පුද්ගලයා අවලංගු කාසියක් හෙවත් නොගන්නා සල්ලියක් වැනි වෙයි.

එබැවින් උස් පහත් භේදයක් හෝ දුප්පත් පොහොසත් බවක් හෝ නොසිතා හුදු කරුණාවෙන් සමාන පැවැත්මෙන් කල් යැවීම රටට කරන සංග්‍රහයකි.

මෙහි සඳහන් සතර සංග්‍රහයෙන් මුළු ලෝවැසියන් සතර ආකාරයකට බෙදූ වදළාක් වැනි ය. මෙයින් මහාජන රඤ්ජනය (ඇල්ම) කළ හැකි ය. මෙයින් තුටුනොවන මිනිසකු නැති බැවින් සුදුසු අවස්ථාවන්හි දී මේ සතර සංග්‍රහයෙන් මිනිසුන් හට සලකන්නට සිතත් වා !



# කුසල් වඩමු

එන්. ඩබ්ලිව්. තිලකරත්න මාමා විසිනි

පස්පව් නොකරමින් කාලය ගෙවන්න
සීලය පිහිටුවා ගුණදම් වඩන්න
මේ බව සිත සිතා පින් රැස් කරන්න
යහපල ලැබෙන බව නුවණින් දකින්න

කරදර විපත් නැත ගුණදම් වඩන කල
දැනුවත් කරයි සසරේ යන ගමන තුල
මර බිය නොම දැනෙයි යහගුණ වඩන කල
ඇයි මිනිසුනේ යන්නේ කටු කොහොල් වල

මිස දිටුවන් ඇසුරින් ඉක්මනින් මිදී
කලණ මිතුරු ඇසුරට සිත යොමා බැඳී
ගුණදම් පුරන කල සිහි නුවණෙහි ම රැඳී
දෙවියොත් මෙවන් අයහට දෙතින් ම වඳී

ගෙවී යන දිවිය සුළු මොහොතකි සැමට
වටහා වෙහෙස වනු සසරින් මිදීමට
මිදිලා අකුසලින් යහ ගුණ දිවි මඟට
වඩවමු නුවණ නිවනේ දොර ඇරීමට



# තුණ්ඩිල ජාතකය

**කොළඹ විශාඛා විදුහලේ විශ්‍රාමලත් ආචාර්යාණි**
**ලක්ෂ්මී පෙරේරා මහාත්මනිය විසිනි**

අප සම්මා සම්බුදුරජාණන් වහන්සේ වේළුවනාරාමයේ දී නිරතුරුව බියෙන් පසු වූ භික්ෂූන් වහන්සේ නමක් වෙනුවෙන් මෙම ජාතක ධර්මය වදාළ සේක.

අපේ ලෝකය ලස්සන වන්නේ සොබාදහම නිසාවෙනි. සුළඟේ සෙලවෙන ගස් වැල්, අතු ඉති සියුම් ශබ්දයක් නංවයි. කුරුලු ගීත මෙන්ම සතුන්ගේ හඬ අපහට සතුට ගෙන දේ. එහෙත් වේළුවනාරාමයෙහි වැඩ වාසය කළ භික්ෂුවක් රැයක දවාලක මෙන්ම කුටියෙහි හෝ ඉන් පිටත සක්මන් කළත් සියුම් ශබ්දයකට පවා බිය වූයේ ය. උන්වහන්සේ මරණ බියෙන් තැති ගත්හ. අන් භික්ෂුවක් බුදුරජාණන් වහන්සේට මේ බැව් දැනුම් දුන් පසු, පෙර ආත්මවල දී පවා මෙම භික්ෂුව ජීවත් වූයේ බියෙන් යැයි වදාළ සේක.

ඈත අතීතයෙහි බ්‍රහ්මදත්ත රජු කල, බෝසතාණෝ ඌරු කුලයක උපන්හ. බාල සොහොයුරෙක් ද විය. දෙසොහොයුරන්ගේ මව එක් දිනක මහලු ගැහැණියක දැක බියට පත් වී, තම දරු දෙදෙනා ද අමතක කර දිව ගියා ය. මහලු කාන්තාව පැටවුන් දෙදෙනා ගෙන

ගොස් තම දරුවන් සේ ආදරයෙන් රැක බලා ගත්තා ය. වැඩිමහල් පැටවා මහාතුණ්ඩිල ලෙසත්, බාල පැටවා චුල්ලතුණ්ඩිල ලෙසත්, මහලු මව නම් තැබුවා ය.

දිනෙක සුරා පානය කළ මිනිසුන් පැටවුන් දෙදෙනා දැක, මස් පිණිස ගෙනයෑමට සැරසුණහ. මහලු මව ඔවුන් පළවා හැරියා ය. දෙවැනි දිනයේ දී මහලු මවට බලයෙන් රා පොවා මත් කළහ. නැවතත් සතුන් දෙදෙනා ඉල්වූ කල, මව චුල්ලතුණ්ඩිලට අඬ ගැසුවා ය. මරණයට බිය වූ චුල්ලතුණ්ඩිල මිනිසුනට අල්වාගත නොහැකි වන සේ ඒ මේ අත දිව්වේ ය. මහා තුණ්ඩිල තම සොයුරාගේ මරණ බිය දැක, මරණයට බිය නොවී, පිරිසිදු දියෙන් නා, කුණු සෝද හැර සුවඳ ගැල්විය යුතු යැයි පැවසී ය. මේ ඉල්ලීම මරණය ප්‍රමාද කිරීමට හේතු විය. මෙය තේරුම් ගැනීමට නොහැකිවූ මිනිස්සු එලෙස පිරිසිදු වූ ඌරන් සිටින්නේ කිනම් පෙදෙසක දැයි විමසූහ. බෝසත් මහාතුණ්ඩිල ඔවුනට මෙහි අදහස පහදා දුන්නේ ය.

"පිරිසිදු දිය කුසල් වැන්න

කුණු අකුසල් වැන්න"

පිරිසිදු දියෙන් කුණු සෝදන්නා සේ, කුසල් දියෙන් අකුසල් සෝදා හැරිය විට මිනිස්සු සිල්වත් වෙති. මේ සිල් සුවඳින් මුළු නගරය ම, රාජ්‍යය ම සිල්වත් වේ වි යැයි බෝසතාණෝ පහදා දුන්හ.

මෙම දහම් කරුණු බරණැස් නුවරට ප්‍රසිද්ධ විය. රජු ඇතුළු රට වැසියෝ බණ අසා පැහැදුණහ. රජ තෙමේ

මහාතුණ්ඩිල හා චුල්ලතුණ්ඩිල රජ මාලිගයට ගෙන්වා රැක බලා ගත්තේ ය. පසුව මුළු රාජ්‍යයේ ම රට වැසියෝ පන්සිල්, අටසිල් රකිමින් ජීවත්වූහ. සොයුරෝ දෙදෙනා වනයට ගියහ.

මහාතුණ්ඩිල දෙසූ දහම - එනම් කුසල් වඩා, අකුසල් නොකර සිටීම, අප අනුගමනය කළ යුතුයි. එවිට අපහට යහපත් මිනිසුන් විය හැකි ය.

එකල බරණැස් රජතුමා ආනන්ද තෙරුන් වහන්සේ ය. චුල්ලතුණ්ඩිල මරණයට බිය වූ භික්ෂුව යි. මහා තුණ්ඩිල තමන් වහන්සේ යැයි බුදුරජාණන් වහන්සේ වදාළ සේක.

● ● ● ● ● ● ● ● ● ● ● ● ● ● ● ● ● ●

"අනාගතයේ ලෝක ආගම විය යුත්තේ ලෝක යථාර්ථය පිළිබඳ කියවෙන ආගමකි. එය පුද්ගල දේවත්වය, භක්තිගෝචරභාවය ඉක්මවා යා යුතු අතර එහි න්‍යායාත්මකභාවය තුළින් මේ ලෝකයෙහි භෞතිකත්වය සහ ආධ්‍යාත්මිකත්වය යන පැතිකඩ දෙක ම ආවරණය විය යුතු ය. තව ද එය ආගමික සංවේදීතාව මත පදනම් වූ, සියලු ජීව සහ අජීව වස්තූන් පිළිබඳ මනා වූ අවබෝධය තුළින් බිහි වුණා වූ අර්ථාන්විත දර්ශනයක් විය යුතු ය."

බුදු දහම ඉහත විස්තරයට පිළිතුරු සපයයි.

**- මහා විද්‍යාඥ ඇල්බට් අයින්ස්ටයින්**



# දුටිමි
# දිවමන් පොත් ගුලක්

**බිනුදි සෙනරත් යාපා විසිනි**

එය ද සිසිල් සුන්දර මැදියම් රැයකි. බකමූණකු ගේ හඬට බිය වී දෝ මම හිටි වන ම පිබිදුණෙමි. මුළු ගෙය ම නිසල ය. ආලින්දයට යාබද කාමරයේ විදුලි පහනට නැඹුරු වී උපැස් යුවළින් පුස්තකයක් වෙත නැඹුරු වූ ඒ වත දැනුදු මා ඉදිරියේ මැවී පෙනේ. ඒ අන් කවරකු නොව අසූ වයස් වූ මාගේ සීයා ය. "ඇයි සීයේ ඔය පාඩම් කරන්නේ, විභාග යක් ද?" මගේ හඬින් ඔහු දැහැනින් මිදුණේ ය. "නෑ පුතේ මේ මම සසරට ගෙනියන්න පුරුද්දක් එකතු කරගන්නවා." "ඒ කිව්වේ සීයේ ?" මම කුතුහලයෙන් ඇසුවෙමි. "පුතේ මම මේ නිදිමරාගෙන පොත් කියවා ලබන දැනුම මතු ආත්මයකට ගෙන යනවා." එදින ඒ කතාවට ම මා මවිත වුව ද අද මම පුනර්භවයක් කරා රැගෙන යන චිත්තය පිළිබඳ දැනුම තුළින් එය සනාථ කර ගත්තෙමි.

නමින් ගුණදාස සිඟානෙත්ති වූ මාගේ සීයා පාඨශාලාචාර්යවරයෙකි. රිදී හැන්දකින් රන්කිරි කට නොගෑ මාගේ මුත්තණුවන් පවුලේ එක ම දරුවා විය. කුඩා කල ම

තම දෙමවුපියන් මිය යෑම නිසා තම සුළු පියාගේ නිවසේ දහසකුත් එකක් බැලමෙහෙවරකම් කරන්නට ඔහුට සිදු වූ බැව් ඔහුගේ ඉතිහාසය සිහිපත් කරමින් සීයා අපට කියා ඇත. අනේක විධ දුක්පීඩා ඉවසාගත නොහැකිව ගමේ පන්සලට ගොස් එහි නැවතී සිට හිමිවරුන්ට උවටැන් කරමින් මගේ සීයා අධ්‍යාපනය ලබා ඇත.

පන්සල් ජීවිතයේ දී දෙමෝලෙන් වී කොටනා විට මෝල්ගස වැදී තැළුණු දකුණු පාදයේ විකෘති වූ නියපොත්ත සීයා අපට පෙන්වුවේ ය. කෙතරම් බාධක දුක්ගැහැට තිබුණ ද තම ඉලක්කය කරා යෑමට හෙතෙම තුළ වූ අප්‍රතිහත ධෛර්යය අපට ද කදිම පාඩමක් උගන්වයි. පිරිවෙන් අධ්‍යාපනය හා පන්සල් පුස්තකාලය පරිශීලනය කරමින් මාගේ සීයා 1957 වසරේ විද්‍යෝදය විශ්වවිද්‍යාලයට ඇතුළු වී ඇත්තේ ඔහු උපන් ගලගම ගමෙහි පළමු සරසවි සිසුවා පමණක් නොව විද්‍යෝදය සරසවියේ පළමු කණ්ඩායමට ඇතුළත් වීමේ වාසනාව ද උදා කරගනිමිනි. ඉතිහාසය පිළිබඳ ගෞරව උපාධිධාරියකු ලෙස විශ්වවිද්‍යාලයෙන් නික්මී ඇති මගේ සීයා පුරාවිද්‍යා චක්‍රවර්තී එල්ලාවල මේධානන්ද හිමියන්ගේ විශ්වවිද්‍යාලයීය සමකාලීනයෙකි.

නිතැනින් ම සරල චාම් දිවියකට උරුමකම් කියූ මාගේ සීයා දැඩි අවිහිංසාවාදියෙකි. කිසිදා මදුරුවකු හෝ මරා නොදමන හෙතෙම ඒ තුළින් තමා ලද අත්දැකීම මෙසේ විස්තර කරයි. "පුතේ කැලේ ගහ කොළ සතා සීපාවා එක්ක රෑ දවල් ගත කරපු මම අද අසූ වයස් ගත වෙලත් කඩියකුට මදුරුවකුට එහා සතෙක් දෂ්ට කරලා නෑ. පුදුමයක් නෑ අපි සතුන්ට හිංසා නොකරන තාක්

උන්ගෙන් අපට හිංසාවකුත් නෑ පුතේ" "අංගුලිමාල පිරිතෙන් කියවෙන්නේ අවිහිංසාවමනේ" දරු ප්‍රසූතියට සූදානම්ව ප්‍රසව වේදනාවෙන් පෙළෙන මවුවරුන් සඳහා සීයා ලවා අංගුලිමාල පිරිත මතුරා තැඹිලි ගෙඩියක් ගෙන යෑමට බොහෝවිට පිරිස පැමිණෙති. ඒ සීයා වැනි අවිහිංසාවාදියකුගේ මුවින් තැඹිලි මතුරා දීම පිළිබඳ ගමේ වැසියන් තුළ වූ දැඩි විශ්වාසය නිසාවෙනි.

මහාචාර්ය පුංචි බණ්ඩාර සන්නස්ගලයන් සමග කහ කුරුළු සංදේශය පිළිබඳ කරන ලද සමීක්ෂණ සම්බන්ධයෙන් මගේ සීයා 2013 වසරේ රාජ්‍ය සම්මානයෙන් ද පිදුම් ලබා ඇති බැව් ආඩම්බරයෙන් කිව යුතුයි. එදින රාජ්‍ය සම්මානය ලබාගැනීමට පවා සීයා සැරසුණේ ඉතාමත් චාම් සරල සුදු අත්කොට කමිසයකින් හා කළු කලිසමකිනි. සීයා රෙදි දැමීමට අල්මාරියක් භාවිත නොකළේ ය. සීයාගේ අතේ ඇඟිලි ගණනට තරම් සමාන වූ ඇඳුම් කිහිපය පමණක් නොව උපාධි සහතිකයට හා අනෙකුත් අධ්‍යාපනික සහතිකවලට සීමා වූ සීයාගේ ධනය සේසත තැන්පත් කර තිබුණේ ද අගුල දැමිය නොහැකි පරණ සූට්කේසයක ය.

සීයා මහා ධනස්කන්ධයක් රැස්කර නොතිබිණි. තම අවමඟුලේ කටයුතු චාම්ව ඉටුකිරීමට ප්‍රමාණවත් වූ තරම් මුදලක් හෙතෙම තම බැංකු ගිණුමේ ඉතිරි කර තිබුණි. ඒකත් සීයා සතු අපරිමිත කරුණාගුණය මෙන් ම සීයා කළ සමාජ සේවාවන් ගේ බල මහිමයෙන් හෙතෙම මහා මිනිස් සේනාවක් රැස්කර ගෙන තිබූ බැව් මළගමට සහභාගී වූ ජනගඟ දැකීමෙන් තහවුරු විය. සීයා වෙසෙන ගමේ මළගමක සිට මංගලෝත්සවයක් දක්වා වූ සෑම උත්සවයක ම මුල්තැන ද සීයාට හිමිවිය.

සීයා ඇවිදින පුස්තකාලයක් ලෙස ගැමියෝ හැඳින්වූහ. මෙලෙස කියවීමට ලිවීමට සීයා කාලය ඉතිරි කර ගත්තේ අපූරු ක්‍රමයකට ය. සීයා නිසි දෙය නිසිතැන තැබීමේ පුරුද්ද ප්‍රගුණ කළ තැනැත්තෙකි. සීයාට නැති වූ පොත්, නැති වූ බඩු සෙවීමට කාලය ගතවූයේ නැත. එසේ ම වැඩ කල් දැමීමේ පුරුද්දක් සීයා තුළ මා කිසිදා දැක නොමැත. එලෙස ම සීයා භාවිත කළේ ඉතා සීමිත භාණ්ඩ සංඛ්‍යාවකි. මේ අපූරු ක්‍රමවේදය තුළ සීයාට ඕනෑ තරම් කාලය උපයාගත හැකිවිය. සීයා අවශ්‍යතා හැල්මේ දුවනු අප දැක නැත. සීයාට තිබූ සරල අවශ්‍යතා සීයා ගුරුවරයකු ලෙස ලබාගත් වැටුපෙන් සපුරා ගැනීමට හැකියාව ලැබිණි. මගේ සීයා 29 වසරක් ගුරුසේවයේ යෙදී සිටියේ ය. හෙතෙම පාසල් ගියේ පා පැදියෙනි. හෙතෙම පාසලෙන් පසු කාලය ද දරුවන්ට අධ්‍යාපනය ලබා දුන්නේ ය. එහෙත් ඒ නොමිලේ ය. අධ්‍යාපන කඩ ලෙස හෙතෙම ටියුෂන් පන්ති හැඳින්වූ අතර සීයා ටියුෂන් ක්‍රමයට කැමති වූයේ නැත. කාලය නිරතුරුව ම ගතවන බවත් කළමනාකරණය කළ යුත්තේ කාලය නොව වැඩසටහන් බවත් සීයා අපට උගන්වා ඇත.

සීයාගේ චරිතය තුළ මා සිත් ගත් ම චරිතාංගය වූයේ කිසිදිනෙක අනුන්ගේ දොස් නොදැකීමේ ගුණයයි. කිසිදා ඔහු යමකුගේ වැරැද්දක් ගැන විවේචනය කරනු මා අසා නැත. නිතර ම අනුන්ගේ හොඳ පමණක් දැකීමේ, ඒ හොඳ ඇගයීමට ලක්කිරීමේ පුරුද්ද සීයා තුළින් නිරතුරුව ම විද්‍යමාන විය.

නිබඳව ම අල්පේච්ඡ දිවි පෙවෙතකින් හා නිවණු මනසකින් පසුවුණු මගේ සීයා මියයන විට 83 වැනි වියේ පසුවිය. මිය යන කාල වකවානුවේ දී පවා හෙතෙම වාරු නොමැති දෙපයින් ගමේ පන්සල වෙත ඇදුණේ තුනුරුවන් වැඳපුදා ගැනීමට ම නොව ඊටත් වඩා මනුසත් කාර්යයක් පෙරටු කරගෙනය. මියයන තෙක් ම මගේ සීයා පන්සලේ කුඩා සාමණේර හිමිවරුන්ට පාලි සංස්කෘත අධ්‍යාපනය ලබා දුන්නේ ය. "අද කාලේ මේව දන්න අය නැහැ නොවැ. මගේ කකුල් පණ තියෙනකම් මං ඇවිත් කියා දෙන්නම් අපේ හාමුදුරුවනේ" සීයා දිනක් කුඩා හාමුදුරුවන් සමඟ කියපු වදන් මගේ මතකයේ සනිටුහන් වී ඇත.

තම අවසන් හුස්ම පොද පවා මනා සිහියෙන්, ආදර්ශයක් දෙමින් හෙළීමට සීයා වාසනාවන්ත විය. සීයා රෝහලේ දැඩිසත්කාර ඒකකයට ඇතුළු කරන විට "නොපවතින කයට කටු බට ගහලා දුක් දෙන්න එපා මහත්තයෝ. මට නිදහසේ යන්න දෙන්න" එය සීයාගේ එක ම ඉල්ලීම විය.

මිය යෑමට පෙර සිටම සීයාගේ ඉල්ලීම වූයේ චාම් අවමඟුල් උත්සවයකි. පරිසරයට බෙහෙවින් ම ආදරය කළ මාගේ සීයා කිසිදු සැරසිල්ලක් කරනවාට අකමැති වූයේ පරිසරය දූෂණය වනවා මෙන් ම ගෙඩිගෙවල් ගොක් කොළ සැරසිලි නිසා ගහකොළට හව භෝගවලට වන හානියට ද අකමැති නිසා ය. "පඨවි ආපෝ තේජෝ වායෝ සතර භූතයන්ගෙන් හටගත් මගේ මළකුණ මහ පොළොවට ම දිරන්න දෙන්න දරුවනේ. වළ බඳින්න එපා මගේ වළ උඩ වැවෙන තණකොළ ගහ හරකෙක් එළුවෙක් කාලා

බඩ පුරවාගනීවි. ඒක මට මහ පිනක්." සීයාගේ ඒ ඉල්ලීම අනුව ම අවමඟුලේ කටයුතු ද ඉතා චාම්ව ඉටු කෙරුණි.

පෙරුම් පුරන බෝසත්වරයකු ම වූ මගේ සීයා මිහිදන් කළ කොතක් නොබඳින ලද සොහොනේ පස් කඳුවැටිය මත රැඳවූ පුවරුවක ගම්වාසීන්ගේ ශෝකය මෙසේ සනිටුහන් කර තිබුණි.

"ඔබ කළ යුග මෙහෙය මිල කළ නොහැක පියේ
ගල කෙටු අකුරු ලෙස අප හද පතුලේ  රැඳේ"

සකසු සටහන

බොරලැස්ගමුව පැපිලියානේ බිනුදි සෙනරත් යාපා විසින් ලියන ලද මෙම ලිපිය උපුටා ගන්නා ලද්දේ "ගමේ ගජමුතු - 1" නම් කෘතියෙනි. පූජ්‍ය කොටපොළ අමරකිත්ති හිමිපාණන්ගේ සංකල්පනයක් අනුව ශාන්ති පදනමේ ප්‍රකාශනයක් ලෙස මෙම කෘතිය එළි දක්වා ඇත්තේ ආදර්ශවත් අපූරු චරිතප්‍රභාවකින් හෙබි ගමේ සැඟවුණු විශිෂ්ට මිනිසුන් ප්‍රකට කොට සමාජය අබිමුවෙහි තැබීමට ය. ගමේ ගජමුතු යන්න සැබැවින් ම අර්ථපූර්ණ නාමකරණයකි. මෙහි උපුටා දක්වා ඇති චරිතය තුළ කුළු ගන්වා ඇති වෙසෙස් සිරිත් ලකුණු මානව සමාජයේ යහ ගමනට කොතරම් නම් උපකාරවත් වේද යන්න විමසා බැලිය යුතු ය. ග්‍රන්ථයෙහි ඇතුළත් වන අනෙක් අපදාන ද මෙබඳු වූ ම චරිතශෝභාවෙන් අලංකාරවත් ය. ශාන්ති පදනමේ මෙම සත්පුරුෂ ව්‍යායාමය සුධී ජන ප්‍රසාදයට ඒකාන්තයෙන් පාත්‍ර විය යුතු ය.